**පන්විල ප්‍රාදේශීය සභාව - 2021**

**--------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

-------------------

1.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

පන්විල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පන්විල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනයකරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබුණු රු.118,200 ක තණකොළ කපන යන්ත්‍ර 06 ක වටිනාකම රු.67,500 ක් ලෙස, රු.50,700 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2022 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය. |

1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | කර්මාන්ත ණයහිමි ශේෂ 08 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන අනුව රු.8,162,675 ක් හා කර්මාන්ත ණයහිමි ලේඛනය අනුව රු.14,359,702 ක් වූයෙන් එම ශේෂ අතර රු.6,197,027 ක වෙනසක් පැවතුණි. | 2022 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු ගිණුම් ශේෂ 04 එකතුව රු.33,731,526 ක් වූ අතර ඉදිරිපත් කර ඇති කාල විශ්ලේෂණ වාර්තාව අනුව එම ශේෂය රු.29,585,357 ක් වූයෙන් රු.4,146,169 ක වෙනසක් පැවතුණි. | උසාවි දඩ, පරිසර බලපත්‍ර ගාස්තු, විවිධ ණයගැති පෙත්සම් කාරක සභා ගාස්තු, මස්කඩ කුලීවල හිඟ ගාස්තු ඇතුළත් වී නොමැති බැවින් වෙනස්කම් සිදුවී තිබුණු බව දන්වා ඇත. | ආදායම් ලේඛන නිවැරදිව යාවත්කාලීන කර, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන උපලේඛන උපයෝගී ලේඛන සමඟ සසඳා බලා නිවැරදිව ඉදිරිපත් කළ යුතු අතර හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රු.10,804,621 ක ආදායම් විෂයයන් 02 ක් සම්බන්ධයෙන් පොත්වලින් කපාහැරීම සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය, උපලේඛන හා කාලවිශ්ලේෂණ ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යක්ෂණය කිරීමට නොහැකි විය. | ජල, උසාවි දඩ, පරිසර බලපත්‍ර, විවිධ ණයගැති, කඩකුලී, මස් කඩ කුලී උපලේඛනය ඉදිරිපත් කර ඇති බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ශේෂවලට අදාළව ලේඛන, උපලේඛන, කාලවිශ්ලේෂණ හා අනෙකුත් අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,716,823 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,491,664 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව සතු මුදල් සභාවේ අරමුණු ඉටුකර ගැනීමට යොදා ගැනීමට හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 131 වගන්තිය ප්‍රකාරව අතිරික්ත මුදල ආයෝජනය කිරීමට කටයුතු නොකර රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමේ මාසිකව රු.9,759,665 සිට රු.17,070,548 ක් දක්වා පරාසයක මුදලක් සමාලෝචිත වර්ෂය පුරා නිෂ්කාර්යව පැවතුණි. | මුදල් අතිරික්තයක් පැවතුණහොත් පරිපූරක ඇස්තමේන්තු සලසා එමඟින් පොදු ජනතාවට සේවා සැලසීමට හෝ සුරැකුම්පත්වල යෙදවීමට කටයුතු කරන බව දන්වා ඇත. | සභා අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව උපයෝජනය කිරීමට හෝ අතිරික්ත මුදල් ආයෝජනය කර ආදායම් උත්පාදනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු.1,631,409 ක හිඟ වරිපනම් හා බදු ශේෂයෙන් රු.1,177,363 ක්ද, වර්ෂයේ බිල් කිරීම් රු.2,756,454 න් රු.1,116,699 ක්ද වර්ෂය තුළදී අයකර නොතිබුණු බැවින් දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු.2,294,063 ක් විය. ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව හිඟ ශේෂ අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී ජංගම සේවා වැනි වැඩ සටහන් පවත්වා කෙසේ හෝ අදාළ හිඟය පියවා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව හිඟ වරිපනම් බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) කඩ කුලී** | | |
| පන්විල පොදු වෙළඳපල සංකීර්ණයේ පිහිටි කඩ කාමර 30කට අදාළව 2016 අගෝස්තු 23 දිනැති තක්සේරුව 2019 ජනවාරි මස ක්‍රියාත්මක කළ පසු කිසිදු කඩ හිමියකු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කඩ කුලී කිසිවක් නොගෙවීම හේතුවෙන් රු.3,582,600 ක හිඟයක් පැවති අතර සෑම කඩ කාමරයකටම අදාළව රු.118,800 ක් ඉක්මවූ හිඟයන් පැවතුණි. එහෙත් මෙම හිඟ මුදල අය කිරීමට අදාළව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සියළු හිඟ මුදල් නීත්‍යානුකූලව අධිකරණය මාර්ගයෙන් අයකර ගැනීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. | නව තක්සේරු අනුව නව ගිවිසුම්වලට එළඹ තක්සේරුව ක්‍රියාත්මක කළ යුතු අතර හිඟ සම්බන්ධයෙන් ගිවිසුම් අනුව කටයුතු කළ යුතුය. |
| **(ඇ) වෙනත් ආදායම්** | | |
| සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟහිටි ත්‍රීරෝද රථ නැවතුම්පොළ ගාස්තු ශේෂය රු.421,675 ක් හා වර්ෂයේ බිල් කිරීම් රු.240,500 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ හිඟයෙන් හා බිල් කිරීමෙන් අයකිරීම් රු.132,800 ක් පමණක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟය රු.529,375ක් විය. | හිඟ මුදල් ඉදිරියේදී අය කරගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව ත්‍රීරෝද රථ නැවතුම්පලවල් විධිමත් කර වාර්ෂික ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 වත්කම් කළමනාකරණය

-----------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ රු.4,404,748 ක් වැය කර ඉදිකර තිබුණු සභාවට අයත් නකල්ස් බඹරැල්ල සංචාරක නිකේතනයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට කිසිදු ආදායමක් උපයා නොතිබුණි. | 2020 වසර මුල් කාලයේ නඩත්තු කටයුතු සිදුකලද මාර්තු මාසය වන විට රටේ පැවති වසංගත තත්ත්වය හා ප්‍රමාණවත් සේවකයින් නොමැති වීම නිසා සංචාරකයින් සඳහා පහසුකම් සැපයීමේ ස්ථානයක් නොමැති බව දන්වා ඇත. | ආදායම් උත්පාදනය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |
| (ආ) | රු.11,184,177 ක් වැයකර ඉදි කර තිබුණු සභාවට අයත් හුළුගඟ නැරඹුම් මැදිරිය හා ඊට යාබදව පිහිටි මහල් 3 කින් සමන්විත ගොඩනැගිල්ල සඳහා සමාලෝචිත වර්ෂයේ දී ගෘහ භාණ්ඩ මිලදී ගැනීමට රු.1,302,814 ක වියදමක් දරා තිබුණු අතර එම ගොඩනැගිල්ල කිසිදු ආදායම් උත්පාදිත කාර්යයකට යොදා නොගෙන 2022 මාර්තු 15 විගණන දින වන විටද නිෂ්කාර්යව පැවතුණි. | හුළුගඟ පිහිටි නැරඹුම් මැදිරිය සහිත සංචාරක නිවාඩු නිකේතන ගොඩනැගිල්ලේ ප්‍රධාන මාර්ගයට සමාන්තරව පිහිටි බිම් මහල රු.30,000 කට හා පළමු බිම් මහල රු.6,000 ක මුදලකට තක්සේරු කර ඇත. ඒ අනුව ඉහත ගොඩනැගිල්ලේ බිම් මහල හා පළමු මහල යන කොටස් දෙකම මහජන බැංකුව වෙත බදු පදනම මත ලබාදීමට තීරණය කර ඇති අතර ඒ සඳහා මහා සභා අනුමැතිය ද ලැබී ඇත. | ආදායම් උත්පාදනය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |
| (ඇ) | සතිපොළක් පවත්වාගෙන යාමට නුසුදුසු භූමියක් තෝරාගෙන 2015 වර්ෂයේදී රු.1,500,000 ක් වැය කර ඉදිකර තිබුණු හුළුගඟ සතිපොළ ගොඩනැගිල්ල බද්දට දීමෙන් 2015 – 2021 වර්ෂවල ඉතා අඩු ආදායමක් උපයා තිබුණි. එමෙන්ම එම භූමියේ කඩ කාමර ඉදිකර නව ආදායම් උත්පාදිත මාර්ගයක් ලෙස යොදා ගැනීමට සභාවේ අවධානය යොමු වී තිබුණද කිසිදු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි. | සතියේ සෑම ඉරිදා දිනයකම සතිපොළ පවත්වා වෙළඳුන්ගෙන් ලැබෙන ආදායම ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | නව ආදායම් උත්පාදනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |